# නව නිපයුමක්:
# කරවිල, ගොටුකොළ කරල්

කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත පිළිබඳව මෙනෙහි කරන විට බොහෝ විට සිතට නැගෙන්නේ ආහාර සැකසීමේ කර්මාන්තයයි. එම අංශයෙන් අපේ රට සැහෙන ප්‍රගතියක් ලබා ඇතත්, එයින් බාහිර අංශයන් දෙස අපේ ජනතාවගේ අවධානය යොමු වන්නේ කලාතුරකිනි. එලෙස මෙම ක්ෂේත්‍රයෙහි දියුණුව සඳහා සාම්ප්‍රදයික මාර්ගයෙන් පරිබාහිරව නිෂ්පාදන ක්‍රියාවලියක නිරත වන ආයතනයක් පසුගිය ද අපට දක්නට ලැබිණ.

එම ආයතනයේ නිෂ්පාදනය කාර්ය දේශීය දැනුම් සම්භාරය උපයෝගී කර ගෙන දියුණු ලෝකයේ දැන් ඉතා විශාල ඉල්ලුමක් ඇති සෞඛ්‍යමය ආහාර නිපදවීමය. මෙම නිෂ්පාදනයන් සියල්ලටම මෙ රටේ හැදෙන වැඩෙන අපේ ආහාරයේ, වෙද හෙදකමේ අත්‍යාවශ්‍ය අංගයක් වන පැලෑටි පමණක් උපයෝගී කර ගැනීම විශේෂත්වයකි.

දියුණු රටවල හොඳ ඉල්ලුමක් ඇති මෙම ආහාර වෙළඳ පොලට මෙරටින් ඉදිරිපත් කෙරෙන්නේ ප්‍රධාන වශයෙන් ගොටුකොළ හා කරවිල කැප්සියුල් (කරල්ය) එයට අමරතව පිටවක්කා එකතුව නමින් තවත් කැප්සියුලයක් අපේ දේශීය වෛද්‍ය ක්‍රමයේ ප්‍රචලිත බෙහෙත් වර්ග නවයක සංයෝගයක් ලෙස ඉදිරිපත් කර ඇත. මේ හැර බෙහෙත් ද්‍රව්‍ය ඇතුළු දේශීය අමු ද්‍රව්‍යයම උපයෝගී කර ගෙන රූ සපුව වඩවන ආලේප වර්ග දහයක් නිපදවීමට ද ආයතනය සමත් වී ඇත.


මහරගම එන්වයර්මන්ටල් ලැබටරීස් සමාගම මෙම නිෂ්පාදන ක්‍රියාවලිය අරඹා ඇත්තේ තුන් වසරක පර්යේෂණ කිරීමෙන් පසුව එම නිෂ්පාදනයන් විද්‍යාත්මකව දියුණු කිරීමෙන් අනතුරුවය. කිසිදු කෘත්‍රිම ද්‍රව්‍යයක් එම නිෂ්පාදන වලට අඩංගු වී නොමැති බවට ඔව්හු සහතික වෙති.

චාමර

සමාගම පවසන අන්දමට කරවිල කරල් දියවැඩියා රෝගීන්ට මෙන්ම නිරෝගී පුද්ගලයන්ට ද ගත හැකි වේ. දේශීය වෛද්‍ය විද්‍යාව අනුව කරවිල යුෂ තේ හැඳි දෙකක් ගැනීම නිර්දේශ කර ඇති හෙයින්, මෙම කරල් දෙකක් දිනපතා ගත යුතු වෙයි. ඖෂධයේ ගුණ රැක ගනු පිණිස මෙම කරල් නිපදවනු ලබන්නේ අපේ සාම්ප්‍රදයික කරවිල වගී වලිනි. ඛනිජ වර්ග හා විටමින් අඩංගු ධාරන ශක්තිය වැඩීම හා ලේ පිරිසිදු කෙරෙන්නේයැයි ද, පිනසට ගුණ දෙන්නේ යැයිද විශ්වාස කෙරෙන ගොටුකොළ කරල් මෙම නිෂ්පාදනවල දෙවැන්නයි.

අනෙක් නිෂ්පාදනය පිටවක්කා එකතුවට දේශීය ඖෂධ වර්ග නවයක් එක්කර ඇත. විශේෂයෙන් මත්ලෝලීත්වයෙන් පෙලෙන අයට ප්‍රතිකර්ම කිරීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යාවේ උපයෝගි කර ගන්නා ඖෂධ යොද ගන්නා එම නිපයුම, මත් ද්‍රව්‍ය නිසා ඇති වන අක්මා ආබාධ වලට ප්‍රතිකර්මයක් සේ යොද ගත හැකිය. එයට නෙල්ලි, කටුකරෝසන, තිප්පිලි, පිටවක්කා, රසකිඳ, මොනරකුඩුම්බිය, බිම්කොහොඹ, පිටසුදුසාරණ හා එළනිටොල් වැනි ඖෂධ අඩංගු වේ. මෙම නිෂ්පාදන සියල්ල කරල් සියයේ සිත් ගන්නා ප්ලාස්ටික් බෝතල් වලින් ලබා ගත හැකිය.

28 වැනි පිටුව බලන්න →



ගොටුකොළ කරල්
අසුරන අවස්ථා

19 වැනි පිටුවෙන්....

## ගොටුකොළ කරල්

දෙවන නිෂ්පාදන වර්ගය රූ සපුව වඩවන ආලේපයයි. හමෙහි කුණු ඉවත් කිරීම, තෙල් සහිත හමෙහි තෙල් ඉවත් කිරීම, වියළි හමට අවශ්‍ය තෙතමනය ලබා දීම, සඳහා උපයෝගී කර ගත හැකි ආලේපන ද මෙම නිෂ්පාදනයින්ට ඇතුළත්ය. මුහුණේ කුරුලෑ ඉවත් කරන ද්‍රව්‍යයක් ද, සිරුරේ ආලේපනයක් ද එයට එක් වී ඇත. මෙම සියලු නිෂ්පාදන වලට අමු ද්‍රව්‍ය වී ඇත්තේ අපේ පැරන්නන් භාවිතා කළ, පිපිඤ්ඤා, දෙහි, කෝමාරිකා, කොකුන්, හඳුන් තෙල් මී පැණි, කුරුඳු තෙල්, සුදු සඳුන්, මුං ඇට ආදියයි.

මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භය පැහැදිලි කළ එම සමාගමේ ප්‍රකාශක යෙකු ''මෙම ක්‍රියාවලි මෙරටට වැඩි වශයෙන් විදේශ විනිමය ලබා ගැනීමේ අරමුණින් බව'' කීය. විදේශ වෙළෙඳ පොලට නිෂ්පාදනයන් ඉදිරිපත් කරන විට නිෂ්පාදනයට අගය එක් කිරීමේ පිළිවෙල අනුව වැඩි මිලක් ලැබෙන කුඩා භාණ්ඩ ඉදිරිපත් කළ යුතුය. ඒ අරමුණු මෙම නිෂ්පාදනයෙන් ඉටු වී යැයි විශ්වාස කෙරේ.

මෙම නිෂ්පාදන ක්‍රියාවලිය අපේ කෘෂි කර්මය ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව සලකා බලන කල්හි අංශ කිහිප යකින් වැදගත්ය. පහසුවෙන් ලබා ගත හැකි අමු ද්‍රව්‍ය සඳහා වැඩි මිලක් ලබා ගැනීම එක් කරුණකි. අනෙක අපේ නිෂ්පාදන ක්‍රියාවලියන් — විශේෂයෙන් දේශීය ඖෂධ — සකස් කිරීමේ දී වෙනස් වන වෙළෙඳ පොල අවශ්‍යතාවයනට අනුරූපව ඉටු කල යුතු බවයි. ඒ සමඟම විවිධ රෝග වලින් පීඩා විඳින ජනතාවට සිත් ගන්නා අයුරින් භාණ්ඩ පහසු මිලට ලබා දීමද තවත් පැසසුම් කළ යුතු කටයුත්තකි.